**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය**

# ලංසු කැඳවීම

**දක්ෂිණ අධිවේගී මාර්ග කොටසේ සහ දක්ෂිණ අධිවේගි මාර්ග දිගුව කොටසේ තොරතුරු තාක්ෂණික කටයුතු සඳහා පුහුණු කම්කරුවන් කොන්ත්‍රාත් පදනම මත ලබාගැනීම සඳහා මිල ගණන් කැඳවීම.**

01. අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමණාකරන අංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් දක්ෂිණ අධිවේගී මාර්ග කොටසේ සහ දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව කොටසේ පහත ව්‍යාපෘතිය සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| කොන්ත්‍රාත් අංකය | ව්‍යාපෘතියේ නම | කම්කරු ප්‍රමාණය | කොන්ත්‍රාත් කාලය (මාස) | ලංසු ආරක්ෂණය (රු.) |
|---|---|---|---|---|
| RDA/EOM&M/SE&ESE/IT/ TECH/2024/ 17 | දක්ෂිණ අධිවේගී මාර්ග කොටසේ සහ දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව කොටසේ තොරතුරු තාක්ෂණික කටයුතු සඳහා සුදුසුකම්ලත් පුහුණු කම්කරුවන් කොන්ත්‍රාත් පදනම මත සැපයීම (ගැලනිගම හා බෙලිඅත්ත අන්තර් හුවමාරු කාර්යාල සඳහා) | 05 | 12 | 100,000.00 |

02. මාර්ග සංවර්ධන අධිකාරියේ අ.මා.මෙ.න හා ක ඒකකය ක්‍රියාත්මක නියෝජිතායතනය වේ.

03. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටියට අනුව සිදුකරනු ලැබේ.

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා ලංසුකරුවන්, මේ හා සමාන ධාරිතාවයකින් යුත් කම්කරු සැපයුම පිළිබඳ පළපුරුද්ද තිබීම සුදුසුකමක් සේ සැලකේ.

05. ලංසු කැඳවීම අවසන් කරන දින සිට කැලැන්ඩර් දින 91 ක් **(2024.09.13)** දක්වා ලංසුව වලංගු විය යුතුය.

06. ලංසු, ඉහත වගුවෙහි දැක්වෙන වටිනාකමින් යුත් ලංසු ආරක්ෂණයකින් සමන්විත විය යුතු අතර එම ලංසු ආරක්ෂණය **2024.10.11** දින දක්වා වලංගු විය යුතුය. වලංගු ලංසු ආරක්ෂණයකින් සමන්විත නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. ලංසුකරු විසින් ලංසු ලියකියවිලි වලට අයත් සෑම පිටුවකම අත්සන් යොදා කාර්යාලීය මුද්‍රාව තැබිය යුතුය.

08. පූර්ව ලංසු රැස්වීම **2024.06.06** වන දින පෙ.ව. **10.00** පැයට කහටගහහේන, වල්ගම, බණ්ඩාරගම දරන ස්ථානයේ පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියට අයත් "අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමණාකරන ඒකකයේ ප්‍රසම්පාදන අංශ කාර්යාලයේදී පැවැත්වේ.

09. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට සිංහල භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක්, එක් ලංසුවක් සඳහා ආපසු නොගෙවනු ලබන රු. **3,000.00** + අදාළ වන බදු මුදල් සමග ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් කහටගහහේන, වල්ගම, බණ්ඩාරගම දරන ස්ථානයේ පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියට අයත් " **අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමණාකරන ඒකකයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය** වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව **2024.05.20 දින සිට 2024.06.13 දින දක්වා** පෙ.ව.9.00 පැය සිට ප.ව. **14.30 පැය කාලය තුළ** ලබාගත හැකිය. 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව, ඒජන්ත/නියෝජිතවරයා සහ ටෙන්ඩරයේ සාර්ථක ජයග්‍රාහකයින් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙහි ටෙන්ඩරයට අදාළව ලියාපදිංචි විය යුතුය. **2024.06.14** දින ප.ව. **2.00** ට ලංසු භාර ගැනීම අවසන් වේ.

10. මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව **2024.06.14** වන දින ප.ව. **2.00** ට පෙර **නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමණාකරන අංශයේ ප්‍රසම්පාදන කමිටුව, අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමණාකරන අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, කහටගහහේන, වල්ගම, බණ්ඩාරගම** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුය. ලංසුපත් බහාලූ ලිපිකවරයේ වම්පස ඉහළ කෙලවරෙහි **"දක්ෂිණ අධිවේගී මාර්ග කොටසේ සහ දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව කොටසේ තොරතුරු තාක්ෂණික කටයුතු වෙනුවෙන් සුදුසුකම්ලත් පුහුණු කම්කරුවන් කොන්ත්‍රාත් පදනම මත සැපයීම (ගැලනිගම සහ බෙලිඅත්ත කාර්යාල සඳහා)"** යනුවෙන් සඳහන් කළ යුතුය.

11. කහටගහහේන, වල්ගම, බණ්ඩාරගම දරන ස්ථානයේ පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියට අයත් අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමණාකරන ඒකකයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේදී ලංසු භාරගැනීම අවසන් වූ වහාම එකී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගී විය හැක.

12. වැඩිදුර විස්තර සඳහා දුරකථන අංක :
    - I. ඉංජිනේරු (පරීක්ෂක - අ.මා.මෙ.න. හා ක ඒකකය),මාර්ග සංවර්ධන අධිකාරිය දු.ක. 0774777689
    - II. ඉංජිනේරු (ඉදිකිරීම් - අ.මා.මෙ.න. හා ක ඒකකය), මාර්ග සංවර්ධන අධිකාරිය :දු.ක. 038-2289201

සභාපති,
අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමණාකරණ අංශයේ ප්‍රසම්පාදන කමිටුව,
මාර්ග සංවර්ධන අධිකාරිය,
කහටගහහේන, වල්ගම, බණ්ඩාරගම